**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය ලෙස දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලැබී තිබුණු රු.11,439,056 ක් සියළු වැඩ සටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ පමණක් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාළව ලැබිය යුතුව තිබුණු රු.13,514,007 ක මූලධන ආධාර නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව ජර්නල් අංක 35 මඟින් මූල්‍ය ප්‍රකාශනවලින් කපා හැර තිබුණි.

(ඇ) රු.43,530 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 05 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.106,266,579 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,899,015 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,581,342 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 23 | 15 | 156 |
| (ii) | බදු කුලී | 1,950 | 1,897 | 244 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 954 | 1,270 | 23 |
| (iv) | වෙනත් ආදායම් | 12,352 | 19,439 | 12,125 |

### 2.2.2 අක්කර බදු හා බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව සභාව විසින් අයකර ගතයුතුව තිබූ රු.155,557 ක් වූ අක්කර බදු සහ රු.243,750 ක් වූ බදුකුලී අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,125,100 |
| (ii) | මුද්දර ගාස්තු | 10,000,000 |

**2.2.4 කඩ කාමර බදුදීම**

සභාවට අයත් වෙළඳ සංකීර්ණවල කඩ කාමර බදුදීම පිළිබඳව 2013 මාර්තු 19 දින සිදු කළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බදුකරු සමග ඇතිකර ගත් ගිවිසුමේ 07 වන කොන්දේසියේ සඳහන් පරිදි බදුකරු විසින් එකී කඩ කාමරයේ හෝ එහි යම් කොටසක් බුක්තිය වෙනත් අයෙකුට විකිණීම, පැවරීම හෝ අතුරු බදුදීම සභාවේ ලිඛිත අවසරය නැතිව නොකළ යුතුය යන්න දක්වා තිබුණ ද, කඩ කාමර 04 ක් අතුරු බදු දී තිබුණි.

(ආ) ගිවිසුමේ 13 වන කොන්දේසියෙහි සඳහන් පරිදි නියමිත දිනට බදු කුලී ගෙවීම අඛණ්ඩව මාස තුනක් පැහැර හරින විට හිඟ කුලී අය කරගෙන, ඒ හේතුව මතම බදු ගැණුම්කරු නෙරපා දැමීමට අවශ්‍ය නීත්‍යානුකූල ඕනෑම ක්‍රියාමාර්ග ගැනීමට බදු ගැණුම්කාර පක්ෂය යටත් වන බවට බදු ගැණුම්කාර පක්ෂය එකඟ වී තිබුණි. ගෙවීම් පැහැර හරින ලද කඩ කාමර 03 ක් පිළිබඳව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) බදු ගැණුම්කාර පක්ෂය විසින් ගිවිසුමේ දක්වා ඇති ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා කඩ කාමර බදු ගෙන ඇතත්, විගණන අවස්ථාව වනවිට කඩ කාමර 12 ක් වසා දමා තිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛ අංක: දපපා/පපාකො/ 2010/01 හි ඡේද අංක 05 මගින් දක්වා ඇති පරිදි සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතුය යන්න දක්වා ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අවස්ථා 26 ක් නිරීක්ෂණය විය.

(ඉ) ඉහත චක්‍රලේඛයේ අංක 06 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර 05 කට වරක් බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළයුතු වුවත්, සභාව සතු කඩ කාමරවල වර්ෂ 05 කට වැඩි කාලයක සිට කුලී තක්සේරු කිරීමක් කර නොතිබුණි. මේ නිසා සභාවට අය කරගත හැකි ආදායම් නොලැබී යාමක් සිදුව තිබුණි.

(ඊ) බටපොල මහවත්ත වෙළඳ සංකීර්ණය කඩ කාමර 09 කින් යුක්ත වුවත්, විගණනය කරන අවස්ථාවේ එක් කඩ කාමරයක් පමණක් විවෘතව තිබුණි. එසේම ගොඩනැගිල්ල දිරා පත් වෙමින් පැවති අතර, එය නවීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ඉඩම් වෙන්දේසි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අනුකූලතා සහතික ලබා නොගැනීම

සභා බලප්‍රදේශය තුළ 2010 වර්ෂයෙන් පසු අනුමත කරන ලද ඉඩම් වෙන්දේසි 14 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොමැති බව 2013 මාර්තු 20 දින කරන ලද විගණන පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය.
ඒ අනුව අනුකූලතා සහතික නිකුත් කර සභාවට ලබාගත යුතුව තිබූ රු.215,000 ක ආදායමක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.
එමෙන්ම දිනකට රු.50 බැගින් වූ රු.167,850 ක දඩ ආදායමක් ද සභාවට අහිමි වී තිබුණි.

### (ආ) 1% බදු අය නොකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වන ඡේදය අනුව සභා බලප්‍රදේශය තුල යම් ඉඩමක් වෙන්දේසි කරන්නේ නම් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක බද්දක් විකුණුම්කරුගෙන් සභාවට අයකර ගත යුතු වුවද, 2010 වර්ෂයෙන් පසු අනුමත කළ ඉඩම් වෙන්දේසි 10 ක තථ්‍ය විකුණුම් වටිනාකම මත 1% බදු අයකර ගැනීමට කටයුතු නොකර, දළ තක්සේරුව මත බදු මුදල් අය කරගෙන තිබීමෙන් සභාවට ලබාගත හැකි ආදායම් අහිමි වී ගොස් තිබුණි.

එමෙන්ම පනතේ 154(2) අනුව ගෙවිය යුතු බද්ද ඉල්ලා සිටීමෙන් දින දාහතරක් ඇතුළත නොගෙවන්නේ නම් අධිකරණය වෙත වාර්තා කර, ආදායම ලබා ගැනීමට කටයුතු කළයුතු වුවත්, විගණන දිනය වූ 2013 මාර්තු 20 දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ඇ) පොදු කටයුතු සඳහා ඉඩම් ලබා නොගැනීම**

---

නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් 1992 සැප්තැම්බර් 30 දින නිකුත් කර තිබුණු අංක:03/02/01/10(ii) දරන චක්‍රලේඛය අනුව හෙක්ටයාර් 1 කට වැඩි සෑම අනු බෙදුමකින්ම වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ ප්‍රමාණයෙන් 10% කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන් කළ යුතුය යන්න දක්වා ඇතත්, වෙන්දේසි කරන ලද ඉඩම් 05 කින් ඊට වඩා අඩු ප්‍රමාණයන් සභාව ලබා ගැනීම නිසා රු.8,958,611 ක පාඩුවක් සභා අරමුදලට සිදුව තිබුණි.

**(ඈ) නීත්‍යානුකූල ඔප්පු ලබා නොගැනීම**

---

සභා බලප්‍රදේශය තුළ සිදු කරන ලද ඉඩම් වෙන්දේසි 04 කින් සභාවට ලබා දී තිබූ පර්චස් 90 ක් වූ ඉඩම් කැබලි 04 කට අදාළ ඔප්පු ලබාගෙන නොතිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ සභාපති, උප සභාපති ඇතුළුව කිසිදු මන්ත්‍රීවරයෙකු විසින් 2011 සහ 2012 වර්ෂ සඳහා විගණන දිනය වූ 2013 මාර්තු 20 දින වනවිටත් අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(අ) සභාවේ සේවය කරන ලද සේවකයින් 11 දෙනෙකුගෙන් රු.40,375 ක ණය ශේෂයක් අයවීම් හිඟහිටව පැවතුණි.

---

(ආ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

**2.5 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයක් ආයතනයේ පිහිටුවා නොතිබුණි. 2006 අගෝස්තු 28 දිනැති හා අංක:PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය